# භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
# திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
# Department of Treasury Operations

මහා භාණ්ඩාගාරය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, තැ.පෙ.1559, කොළඹ 01,
பொதுத் திறைசேரி, நிதி திட்டமிடல் அமைச்சு த.பெ. இல 1559, கொழும்பு 01.
General Treasury, Ministry of Finance & Planning, P.O.Box: 1559, Colombo 01.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General – 2484729, E mail: laliths@tod.treasury.gov.lk
ෆැක්ස් / பெக்ஸ் / Fax – 94 - 11 - 2320042, 94 - 11 - 2484752, 94 - 11 - 2484828
පොදු / பொது / General – 2484500 , 2484600


මගේ අංකය / எனது இல / My No. – ටීඕඩී/ඩී/සීඑම්/2010

ඔබේ අංකය / உமது இல / Your No. –

දිනය / திகதி / Date – 2010 .11. 04

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක :- 6/2010

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

## 2010 වසර සඳහා මුදල් පොත පියවීම සහ අග්‍රිම ගිණුම් පියවීම

2010 වසර අවසානයේ මුදල් පොත පියවීම, අග්‍රිම ගිණුම් පියවීම සඳහා මෙහි පහත සඳහන් පියවරයන් අනුගමනය කර, එම නිශ්චිත දිනට හෝ එදිනට පෙර අදාල කටයුතු සංවිධානය කර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

### 1. 2010 දෙසැම්බර් මාසය සඳහා අග්‍රිම නිදහස් කිරීම

1.1 2010 දෙසැම්බර් මාසයේ සියළුම පුනරාවර්ථන හා ප්‍රාග්ධන ගෙවීම් සම්බන්ධයෙන් වූ අග්‍රිම 2010 දෙසැම්බර් මස 24 දිනට පෙර නිදහස් කිරීමට මෙම දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලැබේ. එබැවින් 2010 වර්ෂයේ සියළුම ගෙවීම් කටයුතු අවසන් කිරීමසඳහා අවශ්‍ය වන ප්‍රාග්ධන හා පුනරාවර්ථන (වැටුප් ද ඇතුළුව) ගෙවීම් වෙනුවෙන් වූ සියළුම අග්‍රිම අවශ්‍යතාවයන් 2010 නොවැම්බර් 30 දිනට හෝ ඊට පෙර මෙම දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. අක්මුදල් අවශ්‍යතාවය ගණනය කිරීමේදී අතැති නිරවුල් කර නොමැති බැදීම් හා දෙසැම්බර් මාසය තුලදී ඊට එකතුවීම්ද, ඉතිරි ප්‍රතිපාදනයන්ද සැලකිල්ලට ගතයුතු අතර, පහත 2.2.1 යටතේ සඳහන් කර ඇති මුදල් ශේෂය අවම හෝ '0' ට ගෙන ඒමට හැකිවන පරිදි අක්මුදල් ඉල්ලුම් කිරීමට වගබලා ගත යුතු බව අවධාරනය කරනු කැමැත්තෙමි. එසේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලා 2010.12.24 දිනට පෙර ප්‍රමුඛතා පදනමින් හැකිතාක් දුරට අවශ්‍ය සියළුම අග්‍රිම නිදහස් කිරීමට මෙම දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය කටයුතු යොදන අතර, විශේෂිත වූ කාරුණක් හැරුණු කොට 2010.12.24 දිනෙන් පසුව 2010 වර්ෂය වෙනුවෙන් අග්‍රිම නිදහස් නොකරන බව කාරුණිකව දන්වා සිටිමි.

1.2 මෙම වැඩපිළිවෙල අනුව මු.රෙ. 215(ඇ) යටතට ගැනෙන බැදීම් හැර අනෙකුත් සියළුම බැදීම් නිරවුල් කිරීමට අවස්ථාව උදාවන හෙයින් මු.රෙ. 215(ඇ) යටතට ගැනෙන බැදීම් හැර අනෙකුත් බැදීම් සඳහා ප්‍රතිපාදන තැන්පත් ගිණුමට මාරුකිරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව නිර්දේශ ලබා නොදෙනු ඇත.

### 2. 2010 දෙසැම්බර් 31 දිනට මුදල් පොත් පියවීම

2.1 2010 වර්ෂයේ මුදල් පොත්, 2010 දෙසැම්බර් 31 දින අවසානයේ පහත සඳහන් ආකාරයට පියවිය යුතුය.

අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් තම කාර්යාල හා උප කාර්යාල වල මුදල් පොත් පියවීම පිණිස වගකිවයුතු මාණ්ඩලික නිලධාරියෙකුට නිලධාරියාගේ නමින් ම බලය පැවරිය යුතු අතර, එම ලිපියේ පිටපතක් විගණකාධිපති වෙත යැවිය යුතුය. එසේ බලය පවරන ලද නිලධාරියා විසින් 2010.12.31 දිනට පසුව කිසිදු මූල්‍යමය ගණුදෙනුවක් 2010 වර්ෂයට අදාල මුදල් පොත් වල සටහන් කල නොහැකි වන සේ, එක් එක් මුදල් පොත් වල එදිනට සටහන් කෙරෙන අවසාන සටහනට යටින් රතු තීන්තෙන් ඉරක් ඇඳ, 2010 වර්ෂයේ මුදල් පොත් වසා තම අත්සන, නම, තනතුර, දිනය හා වේලාව සහිත සටහනක් තැබිය යුතුය.

2.2 2.2.1 අමාත්‍යාංශ හා උපකාර්යාල රහිත දෙපාර්තමේන්තු 2010.12.31 දිනට මුදල් පොතේ ශේෂය සඳහන් කරමින් ආකෘති අංක ටීඕඩී/අයිඑම්පී/06 සම්පූර්ණ කර 2011 ජනවාරි 03 දින ඔබගේ බැංකු ශාඛාවට භාර දිය යුතු අතර බැංකුවෙන් ඔබ වෙත ලැබෙන හර නිවේදනයේ සහතික කරන ලද පිටපත හා ආකෘති අංක ටීඕඩී/අයිඑම්පී/06 හි පිටපත නොපමාව මෙම දෙපාර්තමේන්තුවට ලැබෙන සේ එවිය යුතුය.


අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් ප්‍රවාහ සහ ඒකාබද්ධ අරමුදල් කළමණාකරණය)
மேலதிக பணிப்பாளர் நாயகம் (காசுப்பாய்ச்சலும், திரட்டு நிதி முகாமைத்துவமும்)
Additional Director General (Cash flows & consolidated funds management)
Tele: 2484738
E- mail : padmas@tod.treasury.gov.lk

අධ්‍යක්ෂ (ණය ගැනීම්)
பணிப்பாளர் (கடன் படல்)
Director (Borrowings)
Tele: 2484739
nalino@tod.treasury.gov.lk

අධ්‍යක්ෂ (ආදායම්)
பணிப்பாளர் (வருமானம்)
Director (Revenue)
Tele : 2484741
anandar@tod.treasury.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ණය සේවා සහ ගිණුම්)
மேலதிக பணிப்பாளர் நாயகம் (கடன் சேவைகளும், கணக்குகளும்)
Additional Director General (Debt. Servicing & Accounting)
Tele : 2484748
Fax : 2484828
jayarathnak@tod.treasury.gov.lk

2.2.2 අමාත්‍යාංශ හා උප කාර්යාල සහිත දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලෙකම් කාර්යාල 2010.12.31 දිනට මුදල් පොතේ ශේෂය සඳහා ඉහත 2.2.1 පරිදි ක්‍රියාකර 2011 ජනවාරි 05 දින ඔබගේ බැංකු ශාඛාවට භාර දිය යුතු අතර, බැංකුවෙන් ලැබෙන භර නිවේදනයේ සහතික කරන ලද පිටපත සහ ආකෘති අංක ටීඕඩී/අයිඑම්පී/06 හි පිටපත නොපමාව මෙම දෙපාර්තමේන්තුවට ලැබෙන සේ එවිය යුතුය.

සටහන : ටීඕඩී/අයිඑම්පී/06 ආකෘතිය සම්පූර්ණ කිරීමේදී ඔබගේ බැංකු ගිණුම පවත්වාගෙන යනු ලබන්නේ ලංකා බැංකුව නම් ලංකා බැංකුවේ හා.නි.ලේ. ගිණුමට බැර වශයෙන්ද මහජන බැංකුව නම් මහජන බැංකුවේ හා.නි.ලේ.ගිණුමට බැර වශයෙන්ද වනසේ අදාල නොවන කොටස කපා හරින්න. ටීඕඩී/අයිඑම්පී/06 හා ටීඕඩී/අයිඑම්පී/07 ආකෘතීන් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. (www.treasury.gov.lk)

මෙම දෙපාර්තමේන්තුව විසින් 2011 ජනවාරි මාසයේ වැඩ කරන පළමු දිනයේදී අග්‍රිම නිදහස් කිරීමට කටයුතු කරනු ලබන බැවින් සියළුම අමාත්‍යාංශ දෙපාර්තමේන්තු 2010 වසරේ අග්‍රිම ශේෂයන්ගෙන් කිසිදු කොටසක් රඳවා ගත යුතු නොවේ. වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂයක් නොමැති වුව ද, ඒ බව නොපමාව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුවේ.

2.3 **අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා 2011 වසර වෙනුවෙන් ප්‍රථම අග්‍රිම නිකුත් කිරීමෙන් පසුව අග්‍රිම නිකුත් කරනු ලබන්නේ ඉහත 2.2 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමෙන් අනතුරුව බව කාරුණිකව සලකන්න.**

2.4 උප කාර්යාල වෙත ලබා දී ඇති අතුරු අග්‍රිම හා නිලධාරීන් වෙත ලබා දී ඇති අනෙකුත් අග්‍රිම ද 2010 දෙසැම්බර් මස 31 වන දිනට භාණ්ඩාගාරයට පියවීමට හැකි වන පරිදි අවශ්‍ය පූර්ව විධිවිධාන යොදා ගත යුතුය. ඔබ විසින් උපකාර්යාල වලින් 2010.12.31 මුදල් ශේෂය ලබා ගැනීමේදී ඔබගේ බැංකුව සමඟ සාකච්ඡා කොට ඉහත 2.2.1 පරිදි වූ පහසු ක්‍රමයක් අනුගමනය කිරීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2.5 අග්‍රිම ගිණුම් පියවීම - ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර - 7003/0/0/....../10

2.5.1 ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශාධාර සඳහා 7003/0/0/......./10 සංකේතය යටතේ, ව්‍යාපෘති විසින් ලබා ගත් අග්‍රිමයෙන්, 2010.12.31 දිනට මුදල් පොතේ ශේෂය සඳහන් කරමින් ආකෘති අංක ටීඕඩී/අයිඑම්පී/07 සම්පූර්ණ කර 2011 ජනවාරි 03 දින ඔබගේ බැංකු ශාඛාවට භාරදිය යුතු අතර බැංකුවෙන් ඔබ වෙත ලැබෙන භර නිවේදනයේ සහතික කරන ලද පිටපත හා ආකෘති අංක ටීඕඩී/අයිඑම්පී/07 හි පිටපත සහ ඇමිණුම් 01 අදාල අමාත්‍යාංශයට පිටපතක් ද සහිතව නොපමාව පහත ලිපිනයට ලැබීමට කටයුතු කළ යුතු වේ.

භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්,
ණය සේවා සහ ගිණුම් අංශය,
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව,
කොළඹ 01.

2.5.2 මහජන බැංකුවේ සමහර ප්‍රාදේශීය කාර්යාල ප්‍රධාන කාර්යාලයට පරිගණක ජාල ගතව නොමැති අවස්ථා තිබෙන බැවින් ඔබගේ ව්‍යාපෘති කාර්යාලය නිළ බැංකු ගිණුම එවැනි මහජන බැංකු ශාඛාවක පවත්වාගෙන යන්නේ නම් 7003/0/0/....../10 සංකේතය යටතේ 2010.12.31 දිනට මුදල් පොතේ ශේෂය පියවීම සඳහා "භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්" නමින් ලියන ලද චෙක්පත ඇමුණුම් 01 හා 02 සමඟ අදාල අමාත්‍යාංශයට පිටපතක් ද සහිතව නොපමාව 2.5.1 හි සඳහන් ලිපිනයට ලැබීමට කටයුතු කල යුතුවේ.

2.5.3 ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර යටතේ ලබා දී ඇති අග්‍රිම හැර වෙනත් කිසිදු ලැබීමක් 7003 අග්‍රිමය යටතේ ගිණුම් ගත කළ නොහැකි වන බැවින්, වෙනත් ලැබීම් මෙම අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ඇතුලත් නොකළ යුතු වන අතර එම ලැබීම් 7002 අග්‍රිම ගිණුම් අංකය යටතේ ගිණුම් ගත කල යුතුවේ.

2.6 **පෙර වර්ෂ වෙනුවෙන් පියවිය යුතුව ඇති යම් හිඟ අග්‍රිම ශේෂයන් වේ නම්, ඒවා නොපියවීම ද, ගිණුම් කටයුතු වලට අදාලව මෙම දෙපාර්තමේන්තුවට හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට නියමිත දිනයන් හි ඉදිරිපත් කළ යුතු වන වාර්තා, නිසි කලට ඉදිරිපත් නොකිරීම ද භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් කිරීම නතර කරනු ලැබීමට හේතු වනු ඇත.**

3. මෙම කරුණු සම්බන්ධව පැහැදිලි කිරීම් ලබා ගැනීම තවදුරටත් අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා පහත නම් සඳහන් නිලධාරීන් ඇමතිය හැක.

| නිලධාරියාගේ නම හා තනතුර | අංශය | දුරකථන අංකය |
|---|---|---|
| ටී. නලීන් ඔෂන් මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | ජාතික ආරක්ෂාව, යුක්තිය පසඳලීම<br>සහ නීතිය බලාත්මක කිරීම | 2484739 |

| | | |
|---|---|---|
| එස්. ඒ. එස්. වික්‍රමරත්න මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | යටිතල පහසුකම් සංවර්ධනය<br>සමාජ ආරක්ෂණය, ජීවනෝපාය හා<br>ප්‍රාදේශිය සංවර්ධනය | 2484743 |
| පී.ඩී.එන්.පී.ධර්මරත්න මෙනෙවිය<br>සහකාර අධ්‍යක්ෂිකා | රාජ්‍ය පරිපාලනය,මෙහෙයුම් සහ නියාමනය | 2484744 |
| එම්.ජ්. බී. එල්. මනෝහරී මහත්මිය<br>සහකාර අධ්‍යක්ෂිකා | මානව සම්පත් සංවර්ධනය, කලාව ආගම සහ<br>සංස්කෘතික කටයුතු, විද්‍යා හා තාක්ෂණය,<br>පර්යේෂණ හා සංවර්ධනය | 2484740 |
| කේ. එස්. දයාරත්න මෙනෙවිය<br>සහකාර අධ්‍යක්ෂිකා | නිෂ්පාදන , සේවා සහ පරිසරය | 2484742 |
| ඩබ්.ඒ.සී.එස්. ප්‍රියදර්ශනී මහත්මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂිකා | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශාධාර | 2484751 |

දයානන්ද විදානගමාච්චි
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත :-
1. විගණකාධිපති,
2. රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් } දැනගැනීම සඳහා
3. ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් - කරුණාකර ඉහත 2.5 අනුව කටයුතු කිරීම සඳහා
4. සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව
5. සාමාන්‍යාධිකරී, මහජන බැංකුව } කරුණාකර ඉහත 2.2.1,2.2.2 හා 2.5.1 යටතේ උපදෙස් දී ඇති පරිදි විද්‍යුත් මාධයෙන් ශේෂයන් ප්‍රේෂණය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා

ඇමුණුම 01

## 2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අත්මුදල් සැසඳුම් ප්‍රකාශය
(ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර)

1. අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව:-

2. අග්‍රිම ගිණුම් අංකය :-

3. ව්‍යාපෘතිය :-

රු.

| මාසය | ලබාගත් අග්‍රිම | | | වියදම | | | ඉතිරිය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | RFA (1) | DF (2) | එකතුව (3) | RFA (4) | DF (5) | එකතුව (6) | RFA (1-4) | DF (2-5) | එකතුව (3-6) |
| ජනවාරි | | | | | | | | | |
| පෙබරවාරි | | | | | | | | | |
| මාර්තු | | | | | | | | | |
| අප්‍රේල් | | | | | | | | | |
| මැයි | | | | | | | | | |
| ජූනි | | | | | | | | | |
| ජූලි | | | | | | | | | |
| අගෝස්තු | | | | | | | | | |
| සැප්තැම්බර් | | | | | | | | | |
| ඔක්තෝබර් | | | | | | | | | |
| නොවැම්බර් | | | | | | | | | |
| දෙසැම්බර් | | | | | | | | | |
| **එකතුව** | | | XXX | | | XXX | | | |

රු.

වර්ෂය තුල ලබාගත් මුළු අග්‍රිමය (3) :- XXX

වර්ෂයේ මුළු වියදම (6) :- XXX

2010.12.31 දිනට ශේෂය :- ........
------

**නොපියවූ අත්තිකාරම් : (තිබේ නම්)**

දුන් දිනය ආයතනය හේතුව මුදල රු.

මගේ අංකය :- ..................................

දිනය :- ..................................

අධ්‍යක්ෂ ජනරාල්,
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

**2010.12.31 දිනට ප්‍රතිපූර්ණය කල හැකි විදේශාධාර වෙනුවෙන් වූ මුදල් පොත පියවා ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම**

**ජංගම ගිණුම් අංක . . . . . . . . . . . . .**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව:- ................................................

අග්‍රිම ගිණුම් අංකය :- 7003/0/0/............/10

2010.12.31 දිනට ..............................................................................................ව්‍යාපෘතියේ මුදල් පොතට අනුව හර ශේෂය රු. ................................................ ක් වන බව මෙයින් සහතික කරන අතර, එම සම්පූර්ණ ශේෂය පියවීම වෙනුවෙන් ...................................... අංක ....................................... හා .................................. දිනැති චෙක්පත මේ සමග එවමි. මෙම චෙක්පත ලිවීමෙන් පසුව, තවදුරටත් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට මුදලක් නොමැති බව ද සහතික කරමි. ඉහත මුදල ප්‍රේෂණය කිරීමෙන් අනතුරුව අග්‍රිම ගිණුම පියවේ. /පහත සඳහන් කර ඇති හේතු යටතේ නොපියවේ.

| | හේතුව | මුදල |
|---|---|---|
| 1. | ................................................... | ............................................. |
| 2. | ................................................... | ............................................. |
| 3. | ................................................... | ............................................. |
| 4. | ................................................... | ............................................. |
| | | ------------------------------------- |
| | එකතුව | |
| | | ===================== |

ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මුදල්)
අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට

දිනය :- ................................................

පිටපත : අමාත්‍යාංශ ලේකම් - දැනගැනීම සඳහා